චක්‍රලේඛ අංක 1995/22

මගේ අංකය : 4/විශී4/49(11)
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
'ඉසුරුපාය', ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ,
බත්තරමුල්ල.

1995. 08. 28

සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණකාධිකාරීවරුන් හා
අධ්‍යාපන විද්‍යා පීඨවල පීඨාධිපතිවරුන් වෙත.

## දස මාසික අපාදා වැටුප් ණය අනිකුත් සියලුම ණය වර්ග අදාල වාරිකය ගණනය කිරීම හා ආපසු අයකර ගැනීම

මෙම අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමෙන් ණය මුදල් ගෙවනු ලබන ජාතික පාසැල්වල හා ගුරු විද්‍යාලවල ගුරු භවතුන්ට/කාර්ය මණ්ඩලවලට අදාල වූ දස මාසික ආපදා වැටුප් ණය හා අනිකුත් ණය වර්ග ගෙවීමෙන් අනතුරුව, ණය වාරික පහත සඳහන් අයුරු ගණනය කළ යුතුයි.

02 කලින් මාස හයක් වශයෙන් වූ ආපදා ණය මුදල මාස දහයක් වශයෙන් සංශෝධනය කරමින් නිකුත් කරන ලද අංක 19/94 හා 1995. 05. 23 දාතම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව, ගුරු භවතුන්ට හා අනිකුත් කාර්ය මණ්ඩලවලට දහමාසික වැටුප් ණය හෝ අනිකුත් ණය ගෙවීම් කරන විට ආපසු අයකර ගත යුතු ණය වාරිකය ගණනය කිරීමේදී ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 3: 6 වගන්තියට අනුව ඔවුන්ගේ දනට ලබන වැටුප් පදනම් කරගෙන ණය වාරික ගණනය කර, වාරික අයකර ගත යුතුය. ශ්‍රී ලංකා ගුරු සේවය ක්‍රියාත්මක වීමෙන් අනතුරුව, දනට ගුරු භවතුන්ගේ වැටුප් වැඩි වී ඇති බැවින් ණය ලබාගෙන ඇති ගුරු භවතුන්ගේ නව වැටුප් තලයෙන් 10% ක් හෝ 15% ක් හෝ 20% ක් 25% හෝ 30 ක් හෝ 35 ක් හෝ 40% ක් හෝ වන පරිදි (ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 3: 6 වගන්තිය අනුව) ණය වාරිකය ගණනය කර ආපසු අයකර ගත යුතුය. මේ ආකාරයට ණය වාරික මෙතෙක් ගණන් බලා අයකරගෙන නොමැති නම් වහාම ක්‍රියාත්මක වන පරිදි ණය වාරික ගණන් බලා අනිවාර්යයෙන්ම අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

03 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමේ ණය වාරික මුදල් අයකර ගැනීමේ අවම සීමාවට ළඟා විය හැකි වන පරිදි ණය වාරික නව වැටුප් පියවර අණුව ගණන් බලා අයකර ගත යුතු බවට අවධාරණය කරමි. මෙම චක්‍රලේඛ ලිපිය ලද බව හා මෙම උපදෙස් ක්‍රියාත්මක කරන බව කරුණාකර තහවුරු කරන්න.

එම්.ඩී. ඩී. පීරිස්,
ලේකම්,
අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්
1 විගණකාධිපති - දැ. ගැ. පි.
2 රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල් - දැ. ගැ. පි
3 ගණකාධිකාරී (අභ්‍යන්තර විගණක) - මෙම චක්‍රලේඛ උපදෙස් අනුව ණය වාරික අයකර ගන්නේදැයි සියලුම පළාත්, කලාප හා කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවලට ගොස් පරීක්ෂා කර බලා මා වෙත වාර්තා කරන්න.
4 සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන් - දැ. ගැ. පි.